ධීවර අමාත්‍යාංශය

கடற்றொழில் அமைச்சு

# Ministry of Fisheries



# වාර්ෂික වාර්තාව

## வருடாந்த அறிக்கை

# ANNUAL REPORT

# 2016

## ලංකා ධීවර සංස්ථාව

## இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்

## Ceylon Fisheries Corporation

**MINISTRY OF ORNAMENTAL FISH, FRESH WATER FISH, SHRIMPFARMING, FISHERIES HARBOUR DEVELOPMENT MULTI-DAY FISHERIES AND FISH EXPORTS.**

# CEYLON FISHERIES CORPORATION

# ANNUAL REPORT

# 2016

| පටුන | පිටුව |
| --- | --- |


- ලංකා ධීවර සංස්ථාව පිහිටුවීම හා නීතිමය ව්‍යුහය 01-02
- සාංගමික තොරතුරු 03-04
- දැක්ම හා මෙහෙවර 05
- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයාට භාර දෙන ලිපිය 06
- සභාපතිගේ සමාලෝචනය 07-08
- අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 09-12
- විගණකාධිපතිගේ වාර්තාව 13-22
- විගණකාධිපති වාර්තාවට අදාල පිළිතුරු ලිපිය 23-25
- මූල්‍ය තත්ව ප්‍රකාශය 26
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 27
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය 28
- ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 29
- ගිණුම් සටහන් 30
- මූල්‍ය ප්‍රකාශයේ සටහන් 31-37
- අනුපාත විශ්ලේෂණය 38
- සේවක විස්තර වාර්තාව 39

**ලංකා ධීවර සංස්ථාව පිහිටුවීම හා නීතිමය ව්‍යුහය**

1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වසරේදී ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කරන ලද අතර ව්‍යාපාරික කටයුතු 1965 වසරේදී ආරම්භ කොට ඇත. මූලාරම්භයේදී සංස්ථා අරමුණු වලින් මුළු මහත් ධීවර ක්ෂේත්‍රයම ආවරණය විය. පහත සඳහන් කර ඇති ලංකා ධීවර සංස්ථාවේ අරමුණු 1964.10.01 දිනැති හා අංක 14186 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන්ව ඇත.

1' නීතිගත සංස්ථාව මඟින් කෙලින්ම හා බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් ගැඹුරු මුහුදේ ට්‍රෝලර් යාත්‍රා මඟින් මසුන් ඇල්ලීම.

11. සංස්ථාව විසින් කෙලින්ම හෝ බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් මසුන් සකස් කිරීම, ටින් කිරීම, වේලීම හා සකස් කිරීම, මසුන් අතුරු නිෂ්පාදන කටයුතු.

111. සංස්ථාව විසින් කෙලින්ම හෝ බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් මසුන් තොග වශයෙන් හෝ සිල්ලරට අලෙවි කිරීම හා බෙදාහැරීම.

iv. ශීතාගාර ඇතුළු ධීවර වරායන් හා නැංගුරම් පොලවල් ඉදිකිරීම් නඩත්තු කිරීම.

v. මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන් ආනයනය කිරීම හා අපනයනය කිරීම.

vi. ධීවර කර්මාන්තය සඳහා ආම්පන්න උපකරණ හා වෙනත් අවශ්‍යපෝකරණ ආනයනය කිරීම හා විකිණීම'

vii. ධීවර දෙපාර්තමේන්තුව හෝ රජයේ වෙනයම් දෙපාර්තමේන්තුවක් වෙනුවෙන් ධීවර කර්මාන්තය සංවර්ධනයට අදාල කටයුතු වල නියැලීම.

viii. ධීවර කර්මාන්තය සඳහා බෝට්ටු හා වෙනත් කුඩා යාත්‍රා තැනීම.

ix. ධීවර බෝට්ටු අළුත්වැඩියාව කිරීමේ හා නඩත්තු කිරීමේ පහසුකම් සැපයීම'

x. ධීවර අවශ්‍යෝපකරණ නිපදවීම හා විකිණීම.

මෙම අරමුණු වලින් සමහරක් දැනට අහෝසි වී ඇති බව සඳහන් කළ යුතුය. නමුදු ඉහත ගැසට් පත්‍රයේ සඳහන් wxl (v) දරණ අරමුණු 2011.06.30 දිනැති හා අංක 1712/21 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධනය කරමින් පහත සඳහන් අරමුණු ආදේශ කිරීමට කටයුතු කර ඇත.

1. ස්වසම්පත් කලාපය සහ පිළිගත් ජාත්‍යන්තර රීතිවලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම්වල නිරත වීම.

11. මත්ස්‍ය පිරිසැකසුම් පහසුකම් සැළසීම.

111. දේශීය සහ විදේශීය වෙළඳපොල මසුන් විකිණීම.

iv. අවශ්‍ය යැයි හැඟියන අවස්ථාවන්හිදී මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම.

v. ඉහත සඳහන් කටයුතුවලින් යම් කටයුත්තක් සිදු කිරීම සඳහා දේශීය සහ විදේශිය ආයෝජකයන් සමඟ හවුල් ව්‍යාපාර ගිවිසුම්වලට ඇතුල්වීම.

vi. දේශීය සහ විදේශීය නිෂ්පාදකයා හා බෙදාහරින්නන් නියෝජනය.

ඉහත සංශෝධිත අරමුණු 06 න් ද වර්තමානයේදී ලංකා ධීවර සංස්ථාවේ ප්‍රාථමික ව්‍යාපාර ක්‍රියාකාරකම් 04 ක් ක්‍රියාකාරී ලෙස සිදු කරගෙන යනු ලබයි.

1. සංස්ථා අලෙවිසැල් හරහා මත්ස්‍ය වෙළඳාම.
2. ඇසුරුම් කරන ලද අධිශිත මසුන් අලෙවිය.
3. දිවයින පුරා ව්‍යාපාර පහසුකම් පුළුල් කර මත්ස්‍ය අලෙවිය වර්ධනය කිරීම.
4. අයිස් සැපයුම හා ශීත ගබඩා පහසුකම් සැපයීමට කටයුතු කිරීම.

## සාංගමික තොරතුරු

| | | |
|---|---|---|
| සංස්ථාවේ නම | - | ලංකා ධීවර සංස්ථාව |
| නෛතික ස්වභාවය | - | රාජ්‍ය සංස්ථාව |
| සංස්ථාපනය කරන ලද දිනය | - | 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 ඔක්තෝබර් 01 වන දින |

**අධ්‍යක්ෂකවරුන්** -

| | | |
|---|---|---|
| තුසිත ප්‍රියදර්ශන අළුත්පටබැඳිගේ මහතා | - | සභාපති 2016.01.01 සිට 2016.07.01 දක්වා |
| එස් බාලසුබ්‍රමනියම් මහතා | - | සභාපති 2016.07.15 සිට2016.08.31 දක්වා |
| බී.කේ.ජගත් කුමාර පෙරේරා මහතා | - | සභාපති 2016.09.06 සිට |
| එන්.ඩබ්.පී.ජේ.සනත් ශ්‍රීමාල් පෙරේරා මහතා | - | උප සභාපති 2016.01.01 සිට 2016.03.24 දක්වා |
| ඥානවංශ වීරතුංග මහතා | - | කළමනාකාර අධ්‍යක්ෂක 2016.01.01 සිට |
| පී.ඒ.සිරිනිමල් පෙරේරා | - | කළමනාකාර අධ්‍යක්ෂක 2016.09.08 සිට |
| එන්.පී.කේ.රණවීර මහතා | - | අධ්‍යක්ෂ 2016.04.18 සිට |
| ජී.එස්.පී.ලාල් ප්‍රේමනාත් මහතා | - | අධ්‍යක්ෂ 2016.04.18 සිට 2016.07.01 දක්වා |
| ජී.අශෝක විජේරත්න මහතා | - | අධ්‍යක්ෂ 2016.04.18 සිට |
| එම්.ජී.සුමනසිංහ මහතා | - | අධ්‍යක්ෂ මහා භාණ්ඩාගාර නියෝජිත |
| කොලීන් සී.මුතුමාල මහතා | - | අධ්‍යක්ෂ 2016.01.01 සිට 2016.03.24 දක්වා |

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| | | |
|---|---|---|
| නිලාන් ක්‍රිශාන්ත මිරැන්ඩා මහතා | - | සාමාන්‍යාධිකාරී |
| ඒ.සුජීව චාමික සිල්වා මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් |
| දහම්කිත් ප්‍රසාද් පුස්සැල්ල මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් |
| ඒ.ජේ.චින්තා කුමුදුනී මිය | - | වැ.බ.මුදල් කළමනාකාර |
| ඩී.සී.කරුණාතිලක මහතා | - | අභ්‍යන්තර විගණන නිලධාරී |
| කේ.වී.එච්.බණ්ඩාරනායක මහත්මිය | - | නීති නිලධාරිණී / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් |
| ටී.අනීෂා ප්‍රනාන්දු මිය | - | වැ.බ. සේවක මණ්ඩල කළමනාකාර |

| | |
|---|---|
| ලියාපදිංචි කාර්යාලය | - නො.15, රොක් හවුස් පටුමග, කොළඹ 15’ |
| විගණකවරුන් | - විගණකාධිපති |
| බැංකු කරුවන් | - ලංකා බැංකුව |
| | මහජන බැංකුව |

## දැක්ම

ධීවර නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ සුභසිද්ධිය උදෙසා ධීවර නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන කිරීම සහ මග පෙන්වීමේ ප්‍රමුඛතම වාණිජමය ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

- **එලදායී සංවිධානයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබා දීම**.
- **මසුන් නිෂ්පාදනය, සැකසුම් කිරීම හා අලෙවි කිරීම සඳහා වගකීමෙන් හා සැලකීමෙන් යුක්ත අර්ථාන්විත ආයතනයක් වීම**.
- **ධීවර කාර්මිකයාගේ ආර්ථික හැකියාව ශක්තිමත් කිරීම හා එහි නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීම මත ඉහළ සංවර්ධනයක් ලබා ගැනීම.**
- **නවීන තාක්ෂණය යොදා ගනිමින් සාධාරණ මිලකට උසස් තත්වයෙන් යුත් මසුන් සහ වටිනාකම එකතු කරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන කටයුතු වල හා අලෙවි කටයුතු වල නිරත වීම.**
- **පාරිභෝගිකයාගේ ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් වැඩි දායකත්වයක් ලබා දීමට කටයුතු කිරීම.**

ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙත භාරදෙන ලද ලිපිය

අංක 15, රොක් හවුස් පටුමග,

මෝදර, කොළඹ 15.

2021.11.15

ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නව මහලේකම් කාර්යාලය
කොළඹ - 10

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (ඇ) වගන්තිය සහ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව මා විසින් 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ධීවර සංස්ථාව් වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

1. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2. 2016 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

3. 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

4. 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපතිගේ වාර්තාව.

5. විගණකාධිපති වාර්තාව සඳහා ලංකා ධීවර සංස්ථාව විසින් සපයන ලද පිළිතුර

මෙම වාර්තාව ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී වූ,

සභාපති
ලංකා ධීවර සංස්ථාව

## සභාපතිගේ සමාලෝචනය

ලංකා රජයේ පූර්ණ අධීක්ෂණය හා මග පෙන්වීම ලබන මසුන් අලෙවියේ නිරත ප්‍රමුඛතම හා එකම රාජ්‍ය ආයතනය වනුයේ ලංකා ධීවර සංස්ථාවයි. ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීමට දායකත්වය ලබා දෙමින්, පාරිභෝගික ජනතාව වෙත සාධාරණ මිලට මසුන් ලබා ගැනීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම ලංකා ධීවර සංස්ථාවේ මුඛ්‍ය පරමාර්ථය වේ. සමාජයේ සෑම ජන කොටසකටම සිය ආදායම් මට්ටම අනුව මසුන් මිලදී ගැනීමේ පහසුකම් සලසාදීම, ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීමත් මගින් ජීවන වියදම පහත දැමීමත් සෞඛ්‍යසම්පන්න වූ කුටුම්භයක් ඇති කිරීම සඳහා මසුන් අලෙවියේ සංස්ථාවට අයත් වෙළඳපොල කොටස වැඩිකර ගැනීමේ අවශ්‍යතාවය සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

මසුන් අලෙවියේ නිරත එකම රාජ්‍ය ආයතනය ලෙස ලංකා ධීවර සංස්ථාවට සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇත. එමෙන්ම මසුන් අලෙවිය විවෘත වෙළඳපොල තරඟකාරීත්වය මත තීරණය වන්නක් බැවින් සංස්ථාව විසින් කළමනාකරණ උපාය මාර්ග වන මිල ප්‍රතිපත්තිය, භාණ්ඩ (මසුන් වර්ග) ප්‍රභේදයන්, වෙළඳපොල විවිධාංගීකරණය, අලෙවි ප්‍රවර්ධනය යනාදී කළමනාකරණ උපායමාර්ග තරඟකාරී වෙළඳපොල ජයග්‍රහණය කර ගැනීම සඳහා සාර්ථකව දියත් කොට ඇත.

1 <u>මසුන් මිලදී ගැනීම හා අලෙවිය</u>

ධීවර ප්‍රජාවගේ මසුන් අස්වැන්න සෘජුවම සංස්ථාවට මිලදී ගත හැකිනම් වඩා හොඳ මිලක් ඔවුන්ට ලබා දීමට හැකියාව ඇත. එමෙන්ම ඒ තුලින් පාරිභෝගිකයා වෙත තත්වයෙන් උසස් මසුන් අඩුමිලට ලබා දීමට හැකිවනු ඇත. මෙය සංස්ථාවේ දියුණුවටද සෘජු බලපෑමක් වේ. යාපනය, පේසාලේ, පේදුරු තුඩුව සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල මසුන් අස්වැන්න මිලදී ගැනීමේ වැඩ පිළිවෙල ව්‍යාප්ත කිරීම හා එම ප්‍රදේශවල වෙසෙන ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම උදෙසා ධීවර ගම්මානවලට ගොස් ධීවර ප්‍රජාව හමුවී සාකච්ඡා පවත්වා සාර්ථක ක්‍රියාමාර්ග ගන්නා ලදී. එමෙන්ම වර්ෂය තුලදී නව මිලදී ගැනුම් මධ්‍යස්ථාන ස්ථාපිත කොට සංස්ථාවේ මසුන් මිලදී ගැනීම වැඩි කර ගැනීමට පියවර ගෙන ඇත. ඒ අනුව 2016 වර්ෂය තුලදී මෙ.ටො. 3619ක මසුන් තොගයක් සංස්ථාව මිලදී ගන්නා ලදී.

පැලියගොඩ නවීන අංගෝපාංග වලින් හා වඩාත් පුළුල් වූ පහසුකම්වලින් සමන්විත ඇති නවීන මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සෘජු මග පෙන්වීම හා ආශිර්වාදය යටතේ පත්කරන ලද කළමනාකරණ භාරය විසින් පාලනය වන අතර මෙහි කළමනාකරණ කටයුතු ලංකා ධීවර සංස්ථාව විසින් ඉටුකරනු ලබයි. එමෙන්ම මෙහි ඇතුලත් පතුරු අයිස් යන්ත්‍රාගාරය සහ ශීතාගාරය ලංකා ධීවර සංස්ථාවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලැබේ.

2016 වර්ෂයේදී ලංකා ධීවර සංස්ථාව මසුන් මෙ.ටො.3847ක් සිය අලෙවිසැල් ජාලය ජංගම රිය අලෙවි ව්‍යාපෘතිය, ලංකා සතොස හා කෝප් සිටි අලෙවිසැල් සහ රජයේ රෝහල් මසුන් සැපයීම තුලින් අලෙවි කර ගැනීමට හැකියාව ලැබුණි.

**2.** <u>අයිස් නිෂ්පාදනය හා අලෙවිය</u>

ලංකා ධිවර සංස්ථාවේ තවත් එක් ආදායම් උත්පාදන අංශයක් ලෙස අයිස් නිෂ්පාදනය හා අලෙවිය අනුරාධපුරය, ගාල්ල , හම්බන්තොට සහ පැලියගොඩ අයිස් යන්ත්‍රාගාරවල නිෂ්පාදනය තුලින් මෙ.ටො.9759ක අලෙවිය ළඟා කර ගැනීමට හැකිවිය.

3. <u>මසුන් ටින් කිරීමේ ව්‍යාපෘතිය</u>

ලංකා ධීවර සංස්ථාව සහ හැපීකුක් ෆුඩ්ස් ලංකා පුද්ගලික සමාගම අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ගාල්ල ලංකා ධීවර සංස්ථා පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන ටින්කල මසුන් නිෂ්පාදන කර්මාන්තශාලාව CEYFISH වෙළඳනාමය යටතේ නිෂ්පාදන කටයුතු සිදු කරනු ලැබේ.

**<u>සේවාවන්</u>**

4. **<u>ශීතාගාර පසුකම් සහ සැකසුම් පහසුකම් සැලසීම</u>.**

මෝදර පිහිටි ප්‍රධාන ශීතාගාරය සංස්ථා මසුන් අලෙවියේ කේන්ද්‍රස්ථානය වේ. එමෙන්ම ශීතාගාර ගබඩා පහසුකම් සංස්ථා විධායකයන් වෙත මෙන්ම භාහිර පාර්ශවයන් වෙතද ලබා දෙන ලදී.

5. **<u>සංචාරක බංගලා පහසුකම්</u>**

නුවරඑළිය, කළමැටිය සහ මින්නේරිය නගරයන්හි පිහිටි සංස්ථාවට අයත් නවීන පහසුකම් වලින් සමන්විත සංචාරක බංගලා තුලින් ආකර්ෂණීය හා පළපුරුදු කාර්ය මණ්ඩලයක සේවය මහජනතාව වෙත ලබා දීමට පියවර ගෙන ඇත.

6. **<u>ලාභාලාභ</u>**

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් කටයුතුවලින් රු.මිලියන 247ක ශුද්ධ ලාභයක් වාර්තා වී ඇත. පසුගිය වර්ෂයේ අලාභය රු.මිලියන 259.9කි.

සභාපති

## අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එම කාල සීමාව සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයද සමඟ ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා සතුටින් ඉදිරිපත් කර සිටී.

ලංකා ධීවර සංස්ථාව 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී පිහිටුවන ලදී.

ලංකා ධීවර සංස්ථාව ධිවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවත්නා අතර සංස්ථාව විසින් 2016 වර්ෂය තුලදී කරගෙන යනු ලැබූ කටයුතු පහත ආකාරයට සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- දේශීය වශයෙන් මසුන් මිලදී ගැනීම.
- තොග සහ සිල්ලර පදනම මත  මසුන් අලෙවි කිරීම.
- මත්ස්‍ය අතුරු නිෂ්පාදන මිලදී ගැනීම සහ අලෙවිය.
- අයිස් නිෂ්පාදනය සහ අලෙවිය.
- ශීතාගාර පහසුකම් සැපයීම
- CEYFISH වෙළඳනාමය යටතේ නිෂ්පාදිත ටින්කල මසුන් අලෙවිය

### <u>ව්‍යාපාරික කටයුතු සමාලෝචනය</u>

සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් කටයුතු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් සභාපතිගේ සමාලෝචනය මෙම අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ වැදගත් කොටසක් ලෙස සැලකිය යුතුවේ.

### <u>මූල්‍ය ව්‍යුහය</u>

පසුගිය වර්ෂ කිහිපය තුල සංස්ථාවේ සමස්ථ ආදායම රුබිලියන දෙකකට වැඩි වටිනාකමක් වූ අතර 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය තුල සමස්ථ ආදායම රුමිලියන 257ක් වර්ධනය කර ගැනීමට හැකිවිය. එනමුත් කොන්ත්‍රාත් පදනමේ සේවය කරන සේවකයන් විශාල ප්‍රමාණයක් එකවර ස්ථිර කිරීම හා 2015 අයවැයෙන් රු.10,000/-ක වැටුප් වැඩිවීමක් ලබා දීම හේතුවෙන් පරිපාලන පිරිවැය ඉහළ යාමෙන් සමාලෝචිත වර්ෂයේ ආයතන හා පරිපාලන වියදම්හි වැඩිවීමක් දක්නට ලැබුණි. මෙසේ පොදු කාර්ය පිරිවැයෙහි වැඩිවීමක් දක්නට තිබුනද 2015 වර්ෂයේ අලාභය වෙනුවට සමාලෝචිත වර්ෂය ලංකා ධීවර සංස්ථාව සමස්ථ මෙහෙයුම් ක්‍රියාවලායේ ලාභයක් පෙන්නුම් කරනු ලබයි. සමස්ථ ශුද්ධ ලාභාලාභ සැලකිල්ලට ගැනීමේදී 2013, 2014 හ 2015 වර්ෂ සැලකිය යුතු පිළිවෙලින් රුමිලියන 54.45, 119.19 හා 259.9 ක් වූ අතර 2016 වර්ෂයේදී රුමිලියන 247 ක ශුද්ධ ලාභයක් වාර්ථා වේ.

# සමස්ථ ආදායම හා ලාභාලාභ විස්තරය

| වර්ෂය | සමස්ථ ආදායම රුපියල් මිලියන | දල ලාභය / අලාභය රුපියල් මිලියන | ශුද්ධ ලාභය / අලාභය රුපියල් මිලියන |
|---|---|---|---|
| 2009 | 912 | 258.48 | (103.90) |
| 2010 | 1309 | 384.16 | 59.40 |
| 2011 | 1977 | 605.17 | (68.97) |
| 2012 | 2079 | 701.19 | (41.76) |
| 2013 | 1940 | 657.36 | (54.45) |
| 2014 | 1855 | 563.26 | (119.18) |
| 2015 | 1783 | 428.97 | (259.90) |
| 2016 | | 445.13 | 247.80 |



## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| විධායක නිලධාරීන් | - | 43 |
| ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | - | 281 |
| තාක්ෂණික නිලධාරීන් | - | 151 |
| කණිෂ්ඨ සේවකයින් | - | 279 |
| | | 754 |

## විනය ක්‍රියාමාර්ග

| | | |
|---|---|---|
| නැවත සේවයේ පිහිටුවීම් සංඛ්‍යාව | - | 05 |
| වැඩ තහනම් කිරීම් | - | 06 |

## විධායක තනතුරු සඳහා බඳවා ගැනීම්

| | | |
|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් | - | 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු | - | 01 |

## විධායක තනතුරේ සේවයෙන් ඉවත්වීම්

| | | |
|---|---|---|
| ඉල්ලා අස්වීම | - | 03 |
| විශ්‍රාම ගැන්වීම් | - | 04 |
| පරිවාස කාලය තුල සේවය අවසන් කිරීම් | - | 01 |
| සේවය අවසන් කිරීම් | - | 01 |

**ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම**

ලංකා ධීවර සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලට අදාල කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ කිසිදු බැඳීමක් නොමැත.

**ස්තූති කිරීම**.

සංස්ථාවේ වර්ධකය සහ සාර්ථකත්වය උදෙසා ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමන් විසින් ලබා දෙන ලද සියළු වටිනා උපදෙස්, සහයෝගය හා මගපෙන්වීම් පිළිබඳව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය ස්තූතිය පලකර සිටී. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සියළුම නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෘදයාංගමව අගය කර සිටී. මෙම වර්ෂය තුලදී අප වෙත ලබාදෙන ලද සහයෝගය පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ සියළු නිලධාරීන් හට අපගේ ස්තූතිය පළ කර සිටිමු '

අපගේ වටිනා සම්පත වනුයේ සමස්ථ සේවක පිරිස වන අතර වර්ෂය තුලදී ඔවුන් ලබාදුන් සේවය සහ සහයෝගය පිළිබඳව සමස්ථ කාර්ය මණ්ඩලය වෙත අපගේ ස්තූතිය පළකර සිටිමු.

අපගේ වටිනා පාරිභෝගිකයන් වෙතද රාජ්‍ය ආයතන වෙතද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම ස්තූතිය ප්‍රකාශ කර සිටින අතර ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් නිරන්තරයෙන් දක්වන ලද ඔවුන්ගේ සහයෝගය සහ අප කෙරෙහි දක්වන ලද විශ්වාසය පිළිබඳව ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත විශේෂ ස්තූතිය පළ කර සිටිමු.

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | [illegible]/2019/10 | |
| මබේ අංකය / உமது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | 2020 ජූනි 03 දින | |

22 JUN 2020

23 JUN 2020

සභාපති,

ලංකා ධීවර සංස්ථාව.

**ලංකා ධීවර සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : එෆ්එල්එස්/ඒ/සීඑෆ්සී/1/එෆ්ඒ/2019/10
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2020 ජුනි ෦3 දින

සභාපති,

ලංකාධීවර සංස්ථාව.

**ලංකා ධීවර සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ලංකා ධීවර සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලට ගැලපීම් කර තිබුණේ නම් , අනුගාමික මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බොහෝමයක් මූලිකාංග වලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i.) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 32 ඡේදය අනුව වියදම් වලට එරෙහිව ආදායම්ද වත්කම් වලට එරෙහිව වගකීම්ද හිලව් කල නොහැකි වුවද පිළිවෙලින් රු.362,539 ක මූල්‍ය ආදායම්, මූල්‍ය වියදමට එරෙහිව සහ රු.17,949,853 ක බැර ශේෂ ජංගම වත්කම් වලට එරෙහිවද හිලව් කර තිබුණි.

(ii.) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07

ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ මුදලින් සිදුකල ගනුදෙනු පදනම් කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කළ යුතු වුවත් මුදල් පදනමින් බැහැර වී තිබුණි.

ආ) වත්කම් විකුණුම් ලාභය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අඩුකර දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ වාහන හා අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ජනනය වූ රු. 4,310,037 ක ලාභය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අඩුකර නොතිබූ අතර එම රු.7,854,564 ක් වූ

වත්කම් විකිණීමෙන් ලද මුදල් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම වෙනුවට ඉපයූ ලාභය වූ රු.4,310,037 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

ඈ) මත්තුමගල ඉඩමෙන් ලද රු.1,822,195 ක වන්දි මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ අතර මෙමහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයෙන් අඩුකර දක්වා නොතිබුණි.

ඇ) කල් බදු වාරික ගෙවීම් ක්‍රමය යටතේ මිලදීගත් මෝටර් රථ සඳහා සමාලෝචිත වර්ෂයේ රු.10,779,840 ක් ගෙවා තිබුණද, රු.2,757,424 ක් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ කල්බදු ක්‍රමයට මිලදීගත් වත්කම් වල වටිනාකම වූ රු.6,250,000 ක මුදල ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

ඉ) සමාලෝචිත වර්ෂයේ අලෙවිසැල් ඉදිකිරීම සඳහා වැය කළ රු.9,726,470 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම වෙනුවට රු. 10,670,403 ක් මුදල් ලැබීම් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.

ඊ) ලංකා බැංකු ණය හා ආනයන මසුන් සඳහා ලබාගත් ණය සඳහා එකතුව රු.107,870,455 ක් ගෙවා තිබුණද, ණය ආපසු ගෙවීම් ලෙස රු.113,582,457 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(iii.) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 79 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන වල විලම්භිත ආදායම් බදු සම්බන්ධයෙන් හෙළිදරව්කිරීම් කර නොතිබුණි.

(iv.) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 41 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ලාභලාභ ගිණුමට හඳුනාගත යුතු ක්ෂය වියදම රු.77,930,509 ක් වුවත් 2014 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් වල ධාරණ අගය වැඩිවීම හේතුවෙන් වැඩි වූ ධාරණ අගය මත ක්ෂය ප්‍රමාණය වූ රු.45,328,628 ක් අඩුකර ඉතිරි රු.32,601,799 ක් පමණක් වර්ෂයේ ක්ෂය වියදම් ලෙස ලාභලාභ ගිණුමට හඳුනාගෙන තිබුණි.

(v.) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 120 ඡේදය ප්‍රකාරව සේවක පාරිතෝෂික අරමුදලෙන් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම ගිණුම් වර්ෂය අවසානයේදී නැවත මිනුම් කිරීමේදී හඳුනාගන්නා ලද රු.40,448,828 ක් වූ ආයු ගණන අලාභය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ පෙන්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස පරිපාලන වියදම් යටතේ දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය

සඳහා වූ රු.5,432,304 ක වර්තමාන සේවා පිරිවැය සහ රු. 9,240,249 ක පොලී පිරිවැය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස මෙන්ම වෙනත් විස්තීර්ණ ආදායම් යටතේද වැරදි සහගත ලෙස පෙන්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඉකුත් වර්ෂ වලට අදාලව රු.37,629,527 ක් අඩමාණ ණය සඳහා වෙන්කිරීම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ වෙළඳ ණයගැතියන්ගෙන් අඩමාණ ණය සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබූ අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ ඒ සඳහා හෙළිදරව් කරද නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ දෝෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i.) 2011 වර්ෂය තුලදී ආයතනය සතුව තිබූ රු.2,558,029 ක් වූ ඇසුරුම් තොගයක් සේවකයකු විසින් වංචා කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර වංචා කරන ලද එම ඇසුරුම් තොගය 2016 වර්ෂයේ තොගයට ඇතුලත් කර තිබුණි.

(ii.) සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පුනරාවර්ථන වියදම් දැරීම සඳහා ලද රාජ්‍ය ප්‍රදාන වලින් රු. 865,733,754 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණද එම රාජ්‍ය ප්‍රදාන වලින් රු.130,154,441 ක් ඉකුත් වර්ෂයට අදාල උපචිත වියදම් නිදහස් කිරීම සඳහාද, රු.225,613,104 ක් දීර්ඝකාලීන ණය නිදහස් කිරීම සඳහා සහ රු.19,867,583 ක් මසුන් සැපයුම් ණයහිමියන්ට ගෙවීම් කිරීම සඳහා වැයකර තිබුණි. වගකීම් නිදහස් කිරීම වෙනුවෙන් වැයකරන ලද මුදල්, පුනරාවර්තන ආදායම් ලෙස දැක්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

(iii.) සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට සහ සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු හිඟ දායක මුදල් සහ අධිභාර මුදල ඇතුළුව එකතුව රු.200,025,492 ක් ගෙවන ලෙස 2017 මාර්තු 23 හා 2018 සැප්තැම්බර් 03 දිනවල එම ආයතන වලින් ලිපි මඟින් දන්වා තිබුණද ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කර නොතිබුණි.

(iv.) ප්‍රධාන කාර්යාලය සහ විධායක වල ජංගම ගිණුම් මාසිකව සැසඳීම සිදු නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් මස 31 දිනට තුලනය නොවූ ජංගම ගිණුම් ශේෂය රු. 24,775,216 ක් විය.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i.) 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.208,540,613 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුළ වර්ෂ 02 ට වැඩි රු. 21,700,673 ක්ද වර්ෂ 05 ට වැඩි රු. 55,950,625 ක්ද වසර 10 වැඩි රු. 7,251,427ක්ද විශ්ලේෂණය කල නොහැකි රු.16,676,242 ක ශේෂයක්ද ඇතුළත් වී තිබුණ ද ඒ පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii.) රු. 205,401,508 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුල අවුරුදු 05 ට වැඩි රු.17,912,348 ක්ද, අවුරුදු 2-3 අතර රු.10,677,091 ක්ද අවුරුදු 1-2 ත් අතර රු.73,310,603 ක ශේෂයක්ද නිරවුල් නොකර පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

රු.328,207,284 ක් වූ ණයහිමි ශේෂ 24 කට අදාලව උපලේඛන, ශේෂ සනාථන සහ මූලාශ්‍ර ලියවිලි සහ එකතුව රු. 2,146,366 ක් වූ තොග වටිනාකමට අදාල උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොවූ බැවින්ද වටිනාකමරු.3,038,254,548 ක් වූ'ජ'නල් සටහන් 464 ක් වෙනුවෙන් ජ'නල් වවුචර් පිළියෙල නොකිරීම හේතුවෙන්ද එකී ශේෂ වල නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.

### 2.2.6 නීතිරීති වලට අනුකූල නොවීම.

පහත සඳහන් නීතිරීති වලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති විධානයට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| I. 1971 අංක 38 දරණ මුදල් පනතේ වගන්ති අංක 16 | 74,130,373 | රාජ්‍ය සංස්ථා විසින් බැංකු අයිරා පහසුකම් උපරිම සීමාවක් සඳහා විෂය භාර අමාත්‍ය හා මුදල් අමාත්‍ය අනුමැතියක් ලබාගෙන තිබිය යුතු වුවද ඊට අදාළ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| II. 2002 අංක 14 දරණ එකතු කල අගය මත බදු පනත | | |
| 21 වගන්තිය | 3,794,558 | එකතු කල අගය මත බදු වාර්තාව කාලපරිච්ඡේදය අවසාන වී එළඹෙන මාසයේ අවසාන දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත් සංස්ථාවෙනි කාලපරිච්ඡේද 03 කට අදාල බදු වාර්තා පිළිවෙලින් දින 10 මාස 11 ක් සහ වර්ෂයක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. |
| 26 වගන්තිය | 4,936,312 | සෑම මසකම එකතු කල අගය මත බදු මුදල ඊළඟ මාසයේ 20 දිනට පෙර ගෙවිය යුතු වුවද මාස 10 ක බදු මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| III. 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත | | |
| 3 (ඉ) වගන්තිය | 329,038 | සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම් වෙනුවෙන් බදු වෙන්කිරීම් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| 106 වගන්තිය | | 2016/2017 තක්සේරු වර්ෂය සඳහා වූ ආදායම් බදු වාර්තාව 2017 වර්ෂයේ නොවැම්බර් 30 ට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවිය යුතු වුවද එකී වාර්තාව විගණිත දිනය වන 2020 ජනවාරි 20 දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |
| 120 (ඇ) වගන්තිය | 162,039 | 2016 වර්ෂය සඳහා වූ බදු ගෙවීම් දින 23 සිට දින 30 දක්වා ප්‍රමාද වී තිබුණි. |
| IV. 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු විශේෂ විධි විධාන පනතේ 7 වගන්තිය | 272,500 | කාර්තු 04 කට අදාල මුද්දර ගාස්තු ප්‍රකාශ සහ රු.272,500 මුද්දර ගාස්තු ගෙවීම දින 4 සිට මාස 02 කට අධික කාලයක් දක්වා ප්‍රමාද වී තිබුණි. |
| V. 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතෙහි 04 වගන්තිය | 18,103,648 | 2016 වර්ෂයට අදාල බදු මුදල විගණනය සිදුවන දින දක්වාම ගෙවා නොතිබීම හේතුවෙන් රු.7,766,672 ක දඩ මුදලක්ද ගෙවීමට සිදුවී තිබුණි. |
| VI. 2013 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත | 14,863,218 | 2016/2017 තක්සෙරු වර්ෂයට අදාල ආර්ථික සේවා බදු සහ ගෙවිය යුතු දඩ මුදලක් ගෙවා නොතිබුණි. |
| VII. 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 6 පරිච්ඡේදය | | i) 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 නොවැම්බර් මස ඉදිරිපත් කර තිබූ අතර 2017 හා 2018 වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන 2020 ජනවාරි වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.<br>ii) 2016 වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |

3. කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිත ගෙවීම් ප්‍රමාද වීම නිසා සේවකයන්ට රු. 2,891,330 ක දඩ මුදලක් හා සේවක අර්ථසාධක අරමුදල් හා සේවකභාර අරමුදල් ගෙවීම ප්‍රමාද වීම නිසා රු.45,073,809 ක දඩමුදලක් ද ගෙවීමට සිදු වී තිබුණි.

ඩබ්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

i. මූල්‍ය වියදම් හා මූල්‍ය ආදායම් වෙන් වෙන් වශයෙන් ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 17 යටතේ දක්වා ඇත.

ලැබිය යුතු ගිණුම් වලින් අඩුකළ පසු බොල් ණය හා අඩමාණ ණය ශේෂයන් මේ ආකාරයෙන් හිලව් කර පෙන්වා ඇති අතර 2015 ඇතුළුව මීට ඉහතදී ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලද මේ ආකාරයෙන් හිලව් කර ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

ii. **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක** 07

**අ**),**ආ**,**ඇ ඈ ඉ**,**ඊ**

එකඟ වේ. ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රමිත අංක 07ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

Iii ලංකා ධීවර සංස්ථාවේ සමුච්ඡිත අලාභයක් පෙන්නුම් කරන හෙයින් බදු සඳහා වෙන් කිරීමක් සිදු නොකරන ලදී. ඒ සඳහා විලම්භිත බදු වෙන් කිරීමක් සිදු කළ යුතුය. ඉදිරි වර්ෂයේ ඒ සඳහා හෙලි දරව් කිරීමක් සිදු කරන්නෙමු.

Iv ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධයෙන් 2014 වසරේ සිට මේ දක්වා ගිණුම තබා ඇත්තේ එකම ක්‍රමවේදයකට අනුව වන අතර මීට ඉහතදී මේ පිළිබඳ විගණන විමසුම් ඉදිරිපත් නොවීය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ගැලපීම් සිදු කර ඇත. විමසුමේ දක්වා ඇති පරිදි අදාල ගැලපීම් ඉදිරි මූල්‍ය ප්‍රකාශන වල සිදු කර වත්කම් ක්ෂය කිරීමට අදාල ප්‍රමිතිය ප්‍රකාරව ක්ෂය කිරීම් සිදු කර ඇත. අදාල වත්කම් අපේක්ෂිත භාවිතයට පත්වූ මාසය පදනම් කරගෙන ක්ෂය ගණනය කිරීම් සිදුකර ඇත.

V ආයුගණන වාර්තාවට අනුව ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්නුම් කරන වටිනාකම අදාල වර්ෂයේ වියදමක් ලෙස සංස්ථාව විසින් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත් මීට පෙර වර්ෂවලදී මෙම ගැලපීම 2016 වර්ෂයේදී ගලපා ඇති ආකාරයටම සිදු කර ඇත. මේ සම්බන්ධයෙන් විගණන විමසුම් ඉදිරිපත් නොවුණි. සිදුකල යුතු ගැලපීම් ඉදිරි වර්ෂවලදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගැලපීමට කටයුතු කරයි.

2.2.2.**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

එකඟ වේ. ඉදිරි ගිණුම් වර්ෂවලදි අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

2.2.3 **ගිණුම්කරණ දෝෂ**

i. මේ පිළිබඳව වර්තමාන කළමනාකාරීත්වය දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

ii. එකඟ වේ. අදාල ගැලපීම් සංස්ථා ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුව සිදු කිරීමට වග බලා ගනු ලැබේ.

iii. ගිණුම්කරණ ප්‍රමිත අනුව සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තීන්ගේ භාර අරමුදල් සඳහා ගෙවිය යුතු අධිභාර මුදල් සම්බන්ධයෙන් නඩු පැවරීම් කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ සිදු කර ඇති බැවින් ඒ සඳහා සම්බන්ධිත වගකීම් ආයතනය විසින් හඳුනාගෙන ඇත. මේ වනවිට 2017 වර්ෂයට අදාලව අවසන් ගිණුම් කෙටුම්පත් කර ඇති අතර එහිදී මෙම වගකීම් සඳහා ගැලපීම් සිදු කර ඇත.

iv. එකඟ වේ. 2016 වර්ෂයට පෙර සිටම ජංගම ගිණුම් අතර පවතින වෙනස්කම් හේතු කරගෙන මෙම තුලනය නොවූ ශේෂය පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂයට අදාලව ගනුදෙනු මාසිකව පරීක්ෂා කිරීම් සිදු කරන බැවින් වර්ෂය තුල ගනුදෙනු අතර වෙනසක් නොපවතී.

### 2.2.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

i. එකඟ වේ.

ii. එකඟ වේ

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ලංකා ධීවර සංස්ථාව දශක ගණනාවක සිට ලෙජරය යාවත්කාලීන කිරීම සඳහා ප්‍රධාන ජර්නලයන් මඟින් සිදු කර ඇත. ලෙජරයේ සටහන් කර ඇති සියළුම අයිතමයන් සඳහා ජර්නල් සටහන් එම ප්‍රධාන ජර්නලයේ සටහන් කර ඇත. එය අවශ්‍ය ඕනෑම අවස්ථාවක නිවැරදිතාවය පරීක්ෂා කර ගත හැක. කෙසේ වෙතත් ජර්නල් වවුචර්පත් පිළියෙල කිරීමේදී 2020 වර්ෂයේ සිට සිදු කිරීමට බලාපොරොත්තු වේ.

### 2.2.6 නීතිරීතිවලට අනුකූල නොවීම

I ලංකා ධීවර සංස්ථාව වෙත පැවති බැංකු අයිරා පහසුකම් වල කිසිදු වෙනස් කිරීමක් හෝ ඉහළ නංවා ගැනීමක් (Upgrade) සිදු කර නොමැත. අයිරා පහසුකම් ලබා ගන්නා ලද මූලික අවස්ථාවේ (2019) අදාල අනුමැතීන් එවකට සිටි කළමනාකාරිත්වය විසින් ලබා ගැනීමට කටයුතු කර ඇත.

ii,iii,iv,v,vi

